සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	ඉතිහාසය - I	කාලය / நேரம் / Time	පැය 01යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

උපදෙස්:

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින්, නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. ලංකා ඉතිහාසය හැදෑරීම සඳහා යොදා ගනු ලබන පැරණිම සාහිත්‍ය මූලාශ්‍රය කුමක්ද?
   (1) දීපවංසය (2) මහාවංසය (3) බෝධිවංසය (4) දාඨාවංසය

2. අභිලේඛන ලියා ඇති මාධ්‍ය අනුව සීගිරි ගී අයත් වන්නේ කවර කාණ්ඩයකට ද?
   (1) ශිලා (2) දැව (3) මැටි (4) බිත්ති

3. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් වන්නේ,
   (1) හෝර්ටන් තැන්නය. (2) බණ්ඩාරවෙල ය. (3) බෙල්ලන් බැඳි පැලැස්ස ය. (4) පතිරාජවෙල ය.

4. A හා B තීරු ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

A	B
(1) බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය	A. රොබට් නොක්ස්
(2) ලංකා පුරාවෘත්තය	B. ප්ලිනි
(3) එදාහෙළදිව	C. පාහියන් හිමි
(4) නැචුරාලිස් හිස්ටෝරියා	D. ෆිලිප්පස් බැල්දියස්

   (1) A, B, C, D (2) C, B, A, D (3) C, D, A, B (4) C, B, D, A

5. අතීතයේ දී හේන් වගාවේ දී සිදු නොකළ යුතු කටයුත්තක් වූයේ,
   (1) එළිපෙහෙළි කරගත් කැලෑ කොටස් ගිනි තැබීමයි.
   (2) සතුන්ට ඉන් ඉවත්වන ලෙස ශබ්ද නගා කෑ ගැමයි.
   (3) වගා භූමිය තුළ ඇති විශාල ගස් කපා දැමීමයි.
   (4) වරක් දෙවරක් වගා කොට එම භූමිය අතහැර දැමීමයි.

6. ශ්‍රී ලංකාවේ පැරණිම සෙල්ලිපිවල "කනපෙඩික" නමින් හඳුන්වා ඇති රාජ්‍ය නිලධාරියා වන්නේ,
   (1) රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානියා ය. (2) වෙළෙඳ කටයුතු භාර ප්‍රධානියා ය.
   (3) කාසි අච්චු ගැසීමේ ප්‍රධානියා ය. (4) නාගරික වාස්තු විද්‍යාඥයා ය.

7. අතීත වාරි කර්මාන්තයේ දී "දියකැට පහන" යනුවෙන් හඳුන්වා ඇත්තේ,
   (1) ජලය එක් රැස් කර ගැනීමට භාවිත කළ මැටි බඳුනකි.
   (2) රාත්‍රී කාලයේ දී සොරොව්ව ආසන්නයේ තිබූ පහනකි.
   (3) සොරොව්වේ ජලය පාලනය කිරීම සඳහා යොදා ගත් දණ්ඩකි.
   (4) සිරස් අතර සොරොව්වට සම්බන්ධ කර තිබූ ගල් කුළුනකි.

Past Papers Wiki

8. පූර්ව රාජ්‍ය සමයේ මෙරට කුඩා ප්‍රදේශ පාලනය කළ පුද්ගලයන් සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කුමන නමින් ද?
(1) ගමික (2) පරුමක (3) පරුමකලු (4) ගහපති

- පහත දක්වා ඇති උපදෙස් ඇසුරින් 9 හා 10 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රට	විද්‍යාඥයා	සොයාගත් නිමැවුම
A පෝලන්තය	D ගැලීලියෝ ගැලීලි	G දුරදක්නය
B එංගලන්තය	E අයිසෙක් නිවුටන්	H පෘථිවිය ගෝලාකාර බව
C ඉතාලිය	F නිකලස් කොපර්නිකස්	I ගුරුත්වාකර්ෂණය

9. පෘථිවිය ඇතුළු ග්‍රහලෝක සූර්යයා වටා ගමන් කරන බව සොයා ගැනීමට අදාළ පිළිතුරු කාණ්ඩය වන්නේ,
(1) A, D, G (2) A, F, H (3) B, F, H (4) C, E, I

10. ආකාශ වස්තු නිරීක්ෂණය සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) C, E, G (2) B, E, H (3) C, D, G (4) A, E, G

11. "දටික සුමන" නම් ඇත්දත් ශිල්පියා පිළිබඳ තොරතුරු ඇතුළත් සෙල්ලිපිය කුමක්ද?
(1) වේගිරිය සෙල්ලිපිය (2) මුතුගල්ල සෙල්ලිපිය
(3) කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය (4) සොරබොර වැව සෙල්ලිපිය

12. වසභ රජු මහ වැව් ඉදිකිරීම කෙරෙහි යොමු වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක්ද?
(1) කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීම.
(2) විදේශීය රටවලින් මෙරට ධාන්‍ය සඳහා ඇති වූ ඉල්ලුම සපුරාලීම.
(3) ගංවතුර පාලනය කිරීම.
(4) නාගරික ජනතාවගේ ජල අවශ්‍යතා සපුරාලීම.

13. මෙරට අතීත පාලකයන් ජනතා සුභ සාධනය සඳහා කටයුතු කළ බවට සාක්ෂියක් වන්නේ,
(1) කර්මාන්ත දියුණු කිරීම සඳහා කටයුතු කිරීම යි.
(2) ආගමික සිද්ධස්ථානවලට දීමනා පිරි නැමීම යි.
(3) පරිසරය ආරක්ෂා කිරීම සඳහා නීති පැනවීම යි.
(4) සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීම සඳහා කටයුතු කිරීම යි.

14. අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීමට බලපෑ නිශ්චිත ප්‍රධාන සාධකය කුමක්ද?
(1) අන්තර්ජාතික වෙළඳාම
(2) කෘෂිකර්මාන්තයට යෝග්‍ය භෞතික සාධක පැවතීම.
(3) මල්වතු ඔය ආශ්‍රිතව මහ වැව් ඉදිකිරීමට පහසුවීම.
(4) ප්‍රබල පාලකයන් බලයට පත්වීම.

15. ක්‍රිස්තු වර්ෂ හත්වන සියවස වන විට ලංකාවේ නැගෙනහිර වෙරළ ආශ්‍රිතව පිහිටි දෙමළ ජනතාවගේ වන්දනාමානයට ලක් වූ හින්දු කෝවිල කුමක්ද?
(1) තිරුකේතීශ්වරම් කෝවිල (2) මුන්නේෂ්වරම් කෝවිල
(3) කෝණේශ්වරම් කෝවිල (4) නල්ලූර් කෝවිල

16. අතීතයේ දිග මැනීම සඳහා භාවිත කළ කුඩාම ඒකකය වූයේ කුමක් ද?
(1) ආංගුලය (2) ගුන්ජා (3) පරමාණුව (4) ධරණ

17. මානවම්ම පෙළපතේ පාලකයන් විසින් කොටවන ලද සෙල් ලිපිවල "වදාළ" යන පදයෙන් අදහස් කරන ලද්දේ,
(1) ව්‍යවස්ථාදායකය යි. (2) විධායකය යි. (3) රාජ සභාව යි. (4) අධිකරණය යි.

18. අග්නිදිග ආසියාතික වාස්තු විද්‍යාත්මක ලක්ෂණ දක්නට ලැබෙන පොළොන්නරු යුගයට අයත් කලා නිර්මාණයක් වන්නේ,
(1) පරාක්‍රමබාහු රජ මාලිගය යි. (2) ආලාහන පිරිවෙන යි.
(3) පොත්ගුල් විහාරය යි. (4) සත්මහල් ප්‍රාසාදය යි.

19. අතීතයේ දී අතුරුපසක් ලෙස භාවිත කළ "තිලසංගුලිකා" නම් ආහාරයක් පිළිබඳ සඳහන් වන සාහිත්‍ය මූලාශ්‍රය කුමක්ද?
(1) සද්ධර්මාලංකාරය (2) දම්පියාඅටුවා ගැටපදය
(3) සද්ධර්මරත්නාවලිය (4) සහස්සවත්ථුපකරණය

- පහත A, B, C, D තොරතුරු ඇසුරෙන් 20 හා 21 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
A - බෙලිගල දළදා මැදුරක් තනවා දළදා වහන්සේ තැන්පත් කිරීම.
B - ඉබන් බතූතා නම් අරාබි දේශාටකයා මෙරටට පැමිණීම.
C - කාලිංගරායර සහ චෝඩගංග නම් සෙන්පතියන් ලංකාව ආක්‍රමණය කිරීම.
D - හයවන බුවනෙකබාහු රජුට විරුද්ධව සිංහල සංගෙ නම් කැරැල්ල ඇති වීම.

20. දඹදෙණිය හා යාපහුව රාජධානි සමයේ සිදුවූ සිද්ධීන් ඇතුළත් පිළිතුර කුමක්ද?
(1) A හා B (2) C හා D (3) A හා C (4) B හා C

21. ගම්පොළ හා කෝට්ටේ රාජධානි සමයේ සිදුවූ සිද්ධීන් ඇතුළත් පිළිතුර කුමක්ද?
(1) B හා C (2) A හා C (3) C හා D (4) B හා D

22. යල්පාන වෛපලමාලෙ කෘතියෙහි සඳහන් වන පරිදි යාපනය රාජධානියේ ආරම්භක පාලකයා කවුරුන්ද?
(1) කුලශේකර (2) වික්කිරම (3) විජය කුලංකෙ (4) වරෝදය

23. දෙවන රාජසිංහ නමින් උඩරට රාජධානියේ රාජ්‍යත්වයට පත්වන්නේ,
(1) ටිකිරි බණ්ඩාර කුමරු ය. (2) මහා අස්ථාන කුමරු ය.
(3) කොනප්පු බණ්ඩාර ය. (4) යමසිංහ බණ්ඩාර ය.

24. මහනුවර රාජධානි යුගයේ රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම් හඳුන්වන ලද නම කුමක්ද?
(1) ගබඩාගම් (2) පරවේණිගම් (3) නින්දගම් (4) විහාරගම්

25. "ඩිවිනා කොමඩියා" නම්කාව්‍ය ග්‍රන්ථය රචනා කළ මානවවාදී ග්‍රන්ථ කතුවරයා වූයේ,
(1) ෆ්‍රැන්සිස් පෙට්‍රාක් ය. (2) ෆ්‍රැන්සිස් බේකන් ය.
(3) විලියම් ශේක්ස්පියර් ය. (4) අලගියරි ඩාන්ටේ ය.

26. පුනරුද සමයේ නව චිත්‍ර කලාවක් බිහිකළ මධ්‍යස්ථානය කුමක්ද?
(1) ජිනෝවා (2) රෝමය (3) වැනීසිය (4) ෆ්ලෝරන්ස්

27. පුනරුදයේ ගෝලීය ප්‍රවණතාවයක් නොවන්නේ,
(1) මුද්‍රණ කර්මාන්තය ලොව පුරා පැතිරී යාමයි.
(2) තාක්ෂණය හා විද්‍යාත්මක දැනුම ලොව පුරා පැතිරී යාමයි.
(3) කොන්ස්තන්තිනෝපලය තුර්කි බලයට යටත් වීමයි.
(4) දේශ ගවේෂණය තුළින් නව රටවල් සොයා ගැනීමයි.

28. වගා කටයුතු සඳහා ශෂ්‍ය මාරු ක්‍රමය හඳුන්වා දීම නිසා ඇති වූ වාසියක් වන්නේ,
(1) වැපිරීමට අවශ්‍ය බීජ ප්‍රමාණය අඩුකර ගැනීමට හැකි වීමයි.
(2) ලෙඩ රෝග ව්‍යාප්තිය අවම වීමයි.
(3) මහා පරිමාණ ගොවි බිම් ආරම්භ වීමයි.
(4) දීර්ඝ කාලීන අස්වැන්න අඩු වී යාමයි.

29. ප්‍රථම වරට අශ්ව කරත්ත මඟින් තැපැල් සේවාවන් ආරම්භ කළ ආසියාතික රට වූයේ,
(1) ඉන්දියාව යි. (2) චීනය යි. (3) ශ්‍රී ලංකාව යි. (4) ජපානය යි.

30. ක්‍රි. ව. 1848 සිදුවූ බ්‍රිතාන්‍ය විරෝධී අරගලයේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ,
(1) කුරුණෑගල යි. (2) මහනුවර යි. (3) මාතලේ යි. (4) වෙල්ලස්ස යි.

31. ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණායතනය පිහිටා තිබෙන්නේ,
(1) ලුණුවිල ය. (2) තලවකැලේ ය. (3) වාරියපොළ ය. (4) අගලවත්තේ ය.

32. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉදිකරන ලද කොත්මලේ ජලාශය සඳහා ආධාර ලබාදුන් රට කුමක්ද?
(1) ස්වීඩනය (2) බ්‍රිතාන්‍යය (3) බටහිර ජර්මනිය (4) නැගෙනහිර ජර්මනිය

- 33 හා 34 ප්‍රශ්නවලට පිළිතුරු පහත සඳහන් ප්‍රකාශවලින් ගළපා සපයන්න.
A - නිල නොලත් සාමාජික පිරිස බහුතරය බවට පත්වීම.
B - සීමිත ඡන්ද බලය හඳුන්වා දීම.
C - ජනවාර්ගික නියෝජනය අහෝසි වීම.
D - පළාත්බද නියෝජනය හඳුන්වා දීම.
E - ප්‍රථම වරට උගත් ලාංකිකයෙකු ව්‍යවස්ථාදායක සභාවට ඡන්දයෙන් පත්වීම.

33. කෘෘව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ සිදුවීම් ඇතුළත් ප්‍රකාශ මොනවාද?
(1) A හා C (2) B හා D (3) B හා E (4) E හා D

34. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?
(1) A හා C (2) A හා D (3) B හා C (4) D හා E

35. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය නායකයා ලෙස ජනාධිපතිවරයා සතු විශේෂ වරප්‍රසාදයක් වන්නේ,
(1) රාජ්‍ය උත්සවවල මුලසුන දැරීම යි.
(2) ජනාධිපතිවරයාට විරුද්ධව අධිකරණයක නඩු පැවරීමට නොහැකි වීම යි.
(3) අධිකරණය මගින් වරදකරුවෙකු වූ තැනැත්තෙකුට සමාව දීම යි.
(4) ජාත්‍යන්තර උත්සවවලදී ජනරජය නියෝජනය කිරීම යි.

- පහත A, B, C, D යටතේ දක්වා ඇති යුගලයන්හි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර බලා 36 සිට 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A (1) මුද්දර පනත
(2) බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය

B (1) භාරකාර මණ්ඩලය
(2) භාරකාර රාජ්‍ය ස්වාධීනත්වය හිමිකර ගැනීම.

C (1) සමාජවාදී දර්ශනය
(2) රුසියානු විප්ලවය

D (1) අග්‍රාණ්ඩුකාරවරයා
(2) නාමික විධායක ජනාධිපතිවරයා

36. පළමුවැන්න, දෙවැන්නෙහි ප්‍රතිඵලයක් බවට දැකිය හැකි යුගලය වන්නේ,
(1) A (2) B (3) C (4) D

37. දෙවැන්න සඳහා පළමුවැන්න හේතුවක් වූ බව දැක්වෙන ප්‍රකාශය වන්නේ,
(1) A (2) B (3) C (4) D

38. දෙවැන්න නිසා පළමුවැන්න අහෝසි වූ බව දැක්වෙන යුගලය වන්නේ,
(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු සම්බන්ධතාවයක් නොදැක්වෙන යුගලය වන්නේ,
(1) A (2) B (3) C (4) D

40. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන අධිකරණය වන ජාත්‍යන්තර අධිකරණය පිහිටා ඇත්තේ,
(1) නෙදර්ලන්තයේ හේග් නුවර ය. (2) ඇමරිකාවේ නිව්යෝක් නුවර ය.
(3) පෘතුගාලයේ ලිස්බන් නුවර ය. (4) ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර ය.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	කාලය / நேரம் / Time: පැය 03යි. / විනාඩි 10යි.
ඉතිහාසය - II		

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

සැලකිය යුතුයි;

- I කොටසේ ප්‍රශ්න අංක 01 **අනිවාර්ය** වේ.
- II කොටසින් ප්‍රශ්න **හතරකට** ද, III කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

I කොටස

1) අ). පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද,
(ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) දඹදෙණිය, පුනරීන්, හැමන්හෙල්, රන්ටැඹේ, කවුඩුල්ල වැව, නිල්වලා ගඟ, ගල්ඔය, මුල්ලේරියාව, ඉබ්බන්කටුව, ලුණුවිල, සමන්තකූය, ගෝඨපබ්බත (ලකුණු 12)

(ii) ප්‍රංශය, පොන්ඩිචෙරි, හිරෝෂිමා, බෝල්ටික් මුහුද, ඊශ්‍රායලය, බතාවිය (ලකුණු 06)

ආ). පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුර අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ආර්ථික හැකියාව මත ධනවතුන් හා දුප්පතුන් ලෙස සමාජය බෙදී යාම හඳුන්වන්නේ කුමන නමකින් ද?


B - පුනරුද සමයේ ප්‍රංශයෙන් බිහිවූ මානවවාදී ග්‍රන්ථ කතුවරයා කවුද ?

C - මායාදුන්නේ රජුට නාවික සහාය ලබා දුන් කැලිකටහි පාලකයා කවුද?

D - 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකය හැඳින්වූ නම කුමක්ද?

(ලකුණු 04)

ඉ). A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුර අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



A රූපය

i. A රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

ii. මේවා සොයාගන්නා ලද්දේ කුමන ස්ථානයකින් ද?

iii. මේවා භාවිතා කර ඇත්තේ කුමක් සඳහා ද?

iv. මේවා භාවිතයෙන් සාදන ලද දෑ පලදන ලද්දේ කවුරුන්ද?

PAST PAPERS WIKI



B රූපය

i. B රූපයේ දැක්වෙන පුද්ගලයා කවුරුන්ද?

ii. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ඔහු දැරූ තනතුර කුමක්ද?

iii. 1972 ව්‍යවස්ථාව යටතේ ඔහු දැරූ තනතුර කුමක්ද?

iv. 1972 ව්‍යවස්ථාවට අනුව මෙම තනතුර සඳහා පත් කිරීමේ බලය හිමිවූයේ කා හටද?

(ලකුණු 04)

II කොටස

2) i. a). ශ්‍රී ලංකාව ජනාවාස කරන ලද ආදී කාලීන මානවයා හඳුන්වන නම කුමක්ද? (ලකුණු 01)

b). ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සංස්කෘතික අවධි **දෙක** නම් කරන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සාක්ෂි හමුවී ඇති ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

iii. පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් කරනු ලබන ප්‍රධාන සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය කරුණු **තුනක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

3) i. a). ප්‍රථම වරට විශාල ප්‍රමාණයක් වැව් ඉදිකිරීමට පුරෝගාමී වූ පාලකයා

b). ඇළ මාර්ග මගින් එකිනෙකට සම්බන්ධ කරන ලද කුඩා වැව් පද්ධතිය හැඳින්වීමට වියළි කලාපීය වැසියන් භාවිතා කළ නම

c). රුවන්වැලි මහා සෑයට අලංකාර පබළු පූජාවක් කිරීම සඳහා පබළු ගෙන්වන ලද රට පිළිවෙළින් දක්වන්න. (ලකුණු 03)

ii. රජරට ශිෂ්ටාචාර යුගයේ දී රාජ්‍ය උරුමය හිමි වූ ආකාර **දෙක** නම් කරන්න. (ලකුණු 04)

iii. a). ශ්‍රී ලංකාවේ පැරණිම ගොවිතැන් ක්‍රමය කුමක්ද? (ලකුණු 01)

b). එම ගොවිතැන් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී පරිසරය ආරක්ෂාවන පරිදි අතීත ගොවියා කටයුතු කර ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. අතීත ලාංකේය ජනතාව වාර්ගික සහජීවනයෙන් යුතුව ජීවත් වූ බව කරුණු **තුනක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06)

4) i. පූර්ව ඓතිහාසික යුගයට අයත් විද්‍යාව හා තාක්ෂණය පිළිබිඹු වන අවස්ථා තුනක් දක්වන්න. (ලකුණු 03)

ii. පහත A සිට D දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුර අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - විශාල ප්‍රමාණයේ මැටි බඳුන් කිහිපයක් ළිඳ තුළට බස්සවා එහි බිත්තිය ආවරණය කර ඇති ළිං

B - ඇළ මාර්ග ඉදිකිරීම සම්බන්ධ කටයුතු කළ නිලධාරියා

C - ඇළහැර අමුණ ඉදිකිරීම සඳහා හරස් කරන ලද ගංගාව

D - ගවයන්ගේ ආරක්ෂාව සඳහා කරන ලද යාතු කර්මය (ලකුණු 04)

iii. අතීත වාස්තු විද්‍යාත්මක ශිල්පීන් විසින් සීගිරිය නිර්මාණය කිරීමේදී,

A - ආරක්ෂාව

B - උද්‍යාන අලංකරණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 05)

iv. වැවක ප්‍රධාන අංග තුනක් නම්කර ඒවායේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

5) i. මහනුවර රාජධානියේ ආරම්භක පාලකයාගේ සිට පිළිවෙලින් බලයට පත් වූ රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

ii. පළමු වන විමලධර්මසූරිය රජ උඩරට රාජ්‍ය පෘතුගීසි ග්‍රහණයෙන් බේරා ගැනීම සඳහා සිදු කළ සටන් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii. මහනුවර රාජධානි සමයේ ආර්ථික කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. මහනුවර යුගයේ ජන සමාජයේ දක්නට ලැබුණ කැපී පෙනෙන ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

6) i. ප්‍රංශ ජාතිකයන් විසින් ඉන්දියාවේ පිහිට වූ වෙළඳ නගර තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

ii. 1818 නිදහස් සටන මෙහෙයවීම නිසා ඉංග්‍රීසීන් විසින් මරණ දඬුවම ලබා දුන් උඩරට ප්‍රභූවරු දෙදෙනා නම් කරන්න. (ලකුණු 04)

iii. ඉංග්‍රීසීන්ට උඩරට රාජධානිය යටත් කර ගැනීමට අවශ්‍ය වූයේ ඇයි දැයි කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. 1815 දී ඉංග්‍රීසීන්ට උඩරට රාජධානිය යටත් කර ගැනීමට හැකිවූයේ ඇයිදැයි කරුණු තුනක් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

7) i. පහත සඳහන් සංවිධාන මගින් මුද්‍රණය කරන ලද ප්‍රකාශන නම් කරන්න.

A - වර්ච් මිෂනාරී සංවිධානය

B - ආගමික පුස්තිකා සංගමය

C - බැප්ටිස්ට් සමාගම (ලකුණු 03)

ii. 19 වන සියවස වන විට ශ්‍රී ලාංකික ඓතිහාසික මූලාශ්‍රය පිළිබඳව පුරාවිද්‍යා ගවේශණ සහ කැනීම් සිදුකළ යුරෝපීය උගතුන් **සිව් දෙනෙක්** නම් කරන්න. (ලකුණු 04)

iii. ශ්‍රී ලාංකිකයන්ට දේශපාලන අත්දැකීම් ලබා ගැනීම සඳහා තුඩු දුන් ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දෙන ලද තේ වගාවේ උන්නතිය කෙරෙහි බලපෑ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06)

III කොටස

8) i. කාර්මික විප්ලවය සමයේ පහත නම් සඳහන් පුද්ගලයන් විසින් ලොවට දායාද කළ නිර්මාණ නම් කරන්න.

A - ජේම්ස් හාග්‍රිව්ස්

B - හෙන්රි බෙසමර්

C - ජේම්ස් වොට් (ලකුණු 03)

ii. කාර්මික විප්ලවයට සමගාමීව කෘෂිකර්මාන්තයේ දියුණුවට බලපෑ කරුණු **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

iii. කාර්මික විප්ලවය ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ ඇති කළ බලපෑම කරුණු **දෙකක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

iv. කාර්මික විප්ලවය නිසා ඇති වූ යහපත් ප්‍රතිඵල **දෙකක්** සහ අයහපත් ප්‍රතිඵල **එකක්** විස්තර කරන්න. (ලකුණු 06)

9) i. ඇමරිකන් නිදහස් සටනට බලපෑ නව බදු පනත් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ii. පහත A, B, C, D යටතේ දක්වා ඇති ප්‍රකාශවලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

A - "රාජ්‍ය නම් මමයි, මා අපේක්ෂා කරන ඕනෑම දෙයක් නීත්‍යානුකූලයි" යනුවෙන් ප්‍රකාශ කරන ලද පාලකයා

B - "මේ අවස්ථාවේ අපි බලය අල්ලා නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇත" යනුවෙන් ප්‍රකාශ කරන ලද පාලකයා

C - "අවි බලයෙන් වසර පහක දී ලබා ගත් දේ රැක ගැනීමට තවත් වසර පනහක් සන්නද්ධව සිටිය යුතු" බව ප්‍රකාශ කළ ජර්මන් සෙන්පතියා

D - "ජර්මන් ජාතිය නිර්මල ආර්යයන්ගෙන් පැවත එන ලොව උතුම්ම ජාතිය" බව ප්‍රකාශ කළ ජර්මානු නායකයා

(ඇඩොල්ෆ් හිට්ලර්, වින්ස්ටන් චර්චිල්, වෝන්වෝල්ක්, 16 වන ලුවී, 14 වන ලුවී, වී.අයි. ලෙනින්) (ලකුණු 04)

iii. පළමුවන ලෝක මහා සංග්‍රාමයට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

iv. වර්තමාන ලෝක සාමය රැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025


ශ්‍රේණිය / தரம் / Grade	ඉතිහාසය / History / வரலாறு	සිතියම්
11 ශ්‍රේණිය	II / II / II	

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

(අ) (i)

1. (ஆ) (i)


(a) (i)



(ඇ) (ii)

1. (அ) (ii)

(a) (ii)



PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank